ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ

# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය

දුරකථනය: +94 (1) 249-8100 ෆැක්ස්: +94 (1) 244-9070
විද්‍යුත් තැපෑල: VanHornNT@state.gov http://lk.usembassy.gov

නිවේදන අංක: 20190215

## එක්සත් ජනපද වෙරළ ආරක්ෂක බළකාය ශ්‍රී ලංකා වරාය නිලධාරීන් පුහුණු කරති

පෙබරවාරි 15, කොළඹ: එක්සත් ජනපද වෙරළ ආරක්ෂක බළකාය විසින් පෙබරවාරි 11 සිට 15 දක්වා කොළඹ වරායේ නිලධාරීන් 25 දෙනෙකු සමග වරායේ ආරක්ෂක ධාරිතාව වැඩිකිරීමේ වැඩ සටහනක් පවත්වන ලදී. වරායේ ආරක්ෂක හැකියාවන් වර්ධනයකිරීම සහ භෞතික ආරක්ෂක පද්ධති ශක්තිමත් කිරීමටත්, පවත්වන ලද අභ්‍යාස තුළින් වරායේ ආරක්ෂක සැලසුම් සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම වැඩි දියුණු කිරීමටත් පිටුවහලක් ලැබිණ.

සමුද්‍රීය ආරක්ෂාව වැඩිදියුණු කිරීම, ත්‍රස්තවාදය හා අනෙකුත් තර්ජනයන්ට එරෙහිව වැඩි ආරක්ෂාවක් ලබා දෙනවා පමණක් නොව, ශ්‍රී ලංකාවේ සමෘද්ධිය උදෙසා අනෙකුත් රටවල් සමග වෙළඳාම වැඩිදියුණු කර ගැනීමටත් ශ්‍රී ලංකාවට සහය වනු ඇත.

වරාය ආරක්ෂාව පිලිබඳව ශ්‍රී ලංකාව දැඩි කැපවීමක් පෙන්නුම් කර තිබේයැයි මෙම වැඩ සටහන මෙහෙය වූ එක්සත් ජනපද වෙරළ ආරක්ෂක බළකායේ, ශ්‍රී ලංකා වරාය ආරක්ෂක වැඩ සටහන් සම්බන්ධීකාරක ලුතිනන් මැට් ආර්නෝල්ඩ් පැවසීය. "වෙළඳාම් වැඩිකිරීම සඳහා අත්‍යාවශ්‍ය වන ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම හා කලාපීය වාණිජ කේන්ද්‍රයක් වීමේ ශ්‍රී ලංකා ඉලක්කය සාක්ෂාත් කර ගැනීමටත් මෙම හැකියාවන් වර්ධනය කිරීමේ වැඩ සටහන සහාය වනු ඇත."

වෙරළ ආරක්ෂක බළකායේ ජාත්‍යන්තර වරාය ආරක්ෂක වැඩසටහන 2003 දී පිහිටුවන ලද අතර, සමුද්‍රීය ආරක්ෂණ ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධය පුළුල් කිරීම සඳහා මෙය පිහිටුවන ලදී. මෙම ජාත්‍යන්තර ප්‍රමිති ක්‍රියාත්මක කිරීම නාවික කටයුතුවලට සම්බන්ධ ජාතීන් අතර වූ ලෝක ව්‍යාප්ත සහයෝගීතාවයකි.